නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

# තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)

# පුරප්පාඩු

## අධ්‍යක්ෂ ජනරාල්

ඉහත සඳහන් තනතුර සඳහා 2020 මාර්තු 03 වන දින මෙම පුවත්පතේ පළකරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් අයදුම් කල පුද්ගලයින්, මෑත කාල පරිච්ඡේදය තුළ සිදුවිය හැකි තැපැල් ප්‍රමාදය හේතුවෙන් **නැවත අයදුම්කල** යුතු අතර, නව අයදුම්කරුවන්ට ද මේ සමඟ ඉල්ලුම් කළ හැකිය.

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනත මගින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කරන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, සැලසුම් ක්‍රියාත්මක කිරීම, ප්‍රමිතිකරණය සහ සහතික කිරීම් යනාදී කාර්යයන් ඉටුකිරීමේ ජාතික නියාමන ආයතනය වේ. මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා මතු දැක්වෙන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල් ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරියා වෙයි. කොමිෂන් සභා පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය ආයතනික ව්‍යුහය හරහා ඉටු කිරීමේ ප්‍රධාන වගකීම දරණ නිළධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා එම සමස්ථ කාර්යාවලියම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ඒ අනුව පාලක මණ්ඩලයේ මෙහෙයවීම හා පාලනය යටතේ, පාලක මණ්ඩලය විසින් පවරා දෙනු ලබන කාර්යයන් හා බලතල, ක්‍රියාත්මක කරමින් ආයතනයෙහි සෙසු කාර්ය මණ්ඩලය සඳහා මග පෙන්වමින්, නායකත්වය දෙමින් හා දිරිගන්වමින් ආයතනික සමස්ත අරමුණු ඉටුකර ගැනීමේ වගකීම මෙම තනතුරට පැවරේ.

### තනතුරට පැවරෙන කාර්යයන්

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතින් හා 1999 අංක 50 දරණ සංශෝධිත පනතින් පැවරී ඇති පහත සඳහන් මූලික කාර්යයන් හා කොමිෂන් සභාව විසින් පවරණ සියලුම කාර්යයන්

- ආර්ථිකයේ මානව සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියලුම මට්ටම්වල තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන ක්‍රම සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය
- සහතිකපත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ඇතුලුව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් පිරිනැමීම සඳහා ජාතික මට්ටමේ පිළිගත් ක්‍රමයක් සංවර්ධනය, සහ
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය ලබාදෙන ශිල්පායතන, නියෝජ්‍යායතන සහ අනෙකුත් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය ලබාදෙන ආයතනයන්හි ශාස්ත්‍රීය හා පුහුණු සම්මතයන් පවත්වාගෙන යාම.

### සුදුසුකම්

**බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

1. (අ). ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනතකින් ස්ථාපිත කර ඇති හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය උපාධි ප්‍රදානය කරන ආයතනයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව / අධ්‍යාපන / ආර්ථික විද්‍යාව / කළමණාකරනය/ ස්වභාවික විද්‍යාව යන ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හෝ

වරලත් වෘත්තීය සුදුසුකම් ප්‍රධානය කරන ආයතනයකින් ලබා ගත් ආශ්‍රිත සාමාජිකත්ව ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයට අදාලව ලබා තිබීම.

සහ

(ආ). රාජ්‍ය සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමණාකාර (HM) මට්ටමේ තනතුරක (අධ්‍යාපන හා පුහුණුව ඇතුළුව) අවම වශයෙන් වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. (අ). ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනතකින් ස්ථාපිත කර ඇති හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් දේශීය හෝ විදේශීය උපාධි ප්‍රදානය කරන ආයතනයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව / අධ්‍යා-පනය / ආර්ථික විද්‍යාව / කළමණාකරන /ස්වභාවික විද්‍යාව යන ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සමග ඉහත ක්ෂේත්‍රයකට අදාල ලබාගත් පශ්චාත් උපාධියක් තිබීම.

සහ

(ආ). උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමණාකාර මට්ටමේ තනතුරක :අධ්‍යාපනය හා පුහුණුවද ඇතුළුව) වසර 05ක සේවා කාලයක් සමග කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**ජ්‍යෙෂ්ඨ කළමණාකරණ සේවා ශ්‍රේණියේ** : (HM 2-1) නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් තනතුරේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය (මාසික)** : රු. 98215 - (2700 X 12) - රු.130615 - (වැටුප් කේතය: HM 2-3)

**වයස් සීමාව** : අවුරුදු 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### විශේෂ නිපුණතා

1. වැඩසටහන් කළමනාකරණය හා සංවිධාන කුසලතා.
2. වැඩසටහන් ඵලදායිව ඇගයීමේ හැකියාව.
3. වෙනස්වීම් කළමණාකරනය කිරීමේ හැකියාව.
4. සේවාදායකයින්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඒවා නිවැරදිව සහ කඩිනමින් ඉටුකිරීමේ හැකියාව.
5. සේවකයන් අභිප්‍රේරණය කිරීමේ හැකියාව.
6. විශිෂ්ඨ නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල සබඳතා සහ සන්නිවේදන කුසලතා

### පොදු කරුණු

අ. සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 8% ගෙවිය යුතු අතර, මෙම කොමිෂන් සභාව විසින් වැටුපෙන් 12% සමාන මුදලක් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 3% ට සමාන මුදලක් ගෙවනු ඇත.

ආ. ඉහත මූලික වැටුපට අමතරව රජයේ අනුමත වෙනත් දීමනා හිමිවේ.

ඇ. මෙම තනතුර ස්ථිර වන අතර, පර්වාස කාලයකට යටත් වේ.

ඈ. බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනයේදී ඇති විය හැකි සංශෝධනයන්ට යටත් විය යුතුය.

ඉ. අයදුම්පත් යොමු කිරීමේදී ඉදිරිපත් කරනු ලබන සහතිකවල සහතිකකරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

### වෙනත්

සෑම අපේක්ෂකයෙක්ම

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මනාව ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඇ. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය **2020 ජූලි මස 07** දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. දැනටමත් සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වන අතර සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන්නේද යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතුය. අපැහැදිලි අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලියාපදිංචි තැපැල් අයදුම්පත් එවිය යුත්තේ :

**ලේකම්**
**නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය**
**"නිපුණතා පියස" 354/2, ඇල්විටිගල මාවත,**
**කොළඹ 05.**